Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල**

**සතිය - 28**

**විෂය:-නාට්‍ය හා රංග කලාව**

**ශ්‍රේණිය :- 11**

**Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල**

1 නිවැරදි පිළිතුර තෝරන්න

1. නාට්‍ය කලාවේ ප්‍රභවය ඇති වූයේ,
   i. ඉන්දියාවෙන්
   ii. ඉතාලියෙන්
   iii. ග්‍රීසියෙන්
   iv. එංගලන්තයෙන්

2. ලෝක නාට්‍ය දිනය යෙදෙනුයේ,
   i. මාර්තු 26
   ii. මාර්තු 27
   iii. මාර්තු 28
   iv. මාර්තු 29

3. නාට්‍යමය අවස්ථාවක් යනු,
   i. චරිත කිහිපයක ක්‍රියාකාරිත්වයක් තිබීම
   ii. නාට්‍යක අවසන් දර්ශනය
   iii. ගැටුමක් සහිත අවස්ථාවක් තිබීම
   iv. හාස්‍ය හා උපහාසය අන්තර්ගත අවස්ථාවක් වීම

4. වේදිකා නාට්‍ය කෘති පමණක් සඳහන් ව ඇත්තේ,
   i. සරිගම, හදයා, රාජකපුරු
   ii. හෝ ගානා පොකුණ, අඹ යාළුවෝ, දඬුබස්නාමානය
   iii. වරන්දාස්, තට්ටු ගෙවල්, ජනේලය
   iv. කුවේණි, කුසපබා,පත්තිනි

5. රූපණ කාර්යය වේදිකා නාට්‍යයකදී ඉතා හොඳින් ඉදිරිපත් කල බවට නළුවා තුළ විශ්වාසයක් ගොඩනැගෙන්නේ,
   i. අධ්‍යක්ෂවරයා ප්‍රශංසා කිරීමෙනි
   ii. දීර්ඝ පුහුණුවක් ලද හෙයින්
   iii. නළුවාටම තම රූපය පිළිබඳව ඇති වැටහීමෙන්
   iv. ධනාත්මක ප්‍රේක්ෂක ප්‍රතිචාර මගින්

1) නාට්‍ය නිර්මාණයක් සාර්ථක විම සඳහා දක්ෂ වේෂභූෂණ ශිල්පියෙකුගේ දායකත්වය අත්‍යවශ්‍ය වේ.

   i. වේෂභූෂණ යන්න කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 03)

   ii. රංග වස්ත්‍රාභරණ නිර්මාණ ශිල්පියෙකු විශේෂයෙන් දැන සිටිය යුතු කරුණු 4ක් සඳහන් කරන්න (ලකුණු 04)

   iii. නාට්‍ය නිර්මාණයක් සාර්ථක කර ගැනීම සඳහා වේෂභූෂණ වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 05)

2) පහත සඳහන් කතා සාරාංශය නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. (ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව වෙනස් කල හැක)

   "උදෑසන 4ට පමණ දුරකථනය නාද වීමත් සමග නිවසේ සියලු දෙනාම අවදිවිය. දුරකතනය අතට ගත් මවට අනෙක් පසින් ඇසුනේ අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අන්තර්ජාලයට මුදාහැර ඇති බවය. තම එකම දියණිය ඉතා සාර්ථක ලෙසින් විභාගයට පෙනී සිටි නිසා මවත් පියාත් නින්දේ සිටින දියණිය අවදි නොකරම වහා පරිගණකය ඇති කාමරයට ගියේ ප්‍රතිඵල බැලීමට ය.'
   '

   i. කාලය, පසුබිම, චරිත මැවීමට සුදුසු පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කර තිබීම සඳහා (ලකුණු 04)

   ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩනංවා තිබීම සඳහා (ලකුණු 04)

   iii. නාට්‍යෝචිත අවස්ථා සහිතව නිර්මාණය කර තිබීම සඳහා (ලකුණු 04)